## ඡන්දදායකයාගේ භූමිකාව

ඔබේ ග්‍රාමයේ/නගරයේ සංවර්ධනයට හා යහපාලනයට ඔබ පත් කර ගන්නා නියෝජිතයන් තෝරා ගැනීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව සැලකිල්ලක් දක්වා මනා අවබෝධයකින් හා වගකීමකින් යුතුව ඔබේ වටිනා ඡන්දය පාවිච්චි කරන මෙන් ඉල්ලමු.

1. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා නොකරන මැරකම්වල යෙදෙන, දූෂණ වංචාවලට වරදකරුවන් වී ඇති මහජන දේපළ කොල්ලකන අපේක්ෂකයින් දෙවරක් නොසිතා බැහැර කරන මෙන් ඉල්ලා සිටිමු.

2. මැතිවරණ නීතිය හෝ රටේ පවතින නීතිය කඩ කරමින් තම ප්‍රචාරක කටයුතු ගෙන ගිය අපේක්ෂකයන් බලයට පත් වුවහොත් තම නිළ බලය තම වාසියට පාවිච්චි කරන බවට දැනටමත් පූර්වාදර්ශ සපයා ඇති බව සලකන්න

3. ජාතිය, ආගම, කුලය, ලිංගිකත්වය ආදී කරුණු පදනම් කරගෙන විෂමකාරී ප්‍රකාශනයන් නිකුත් කරන්නන් ප්‍රතික්ෂේප කරන්න.

4. පළාත් පාලන ආයතනවලට අදාළ නොවන යෝජනා හා සටන් පාඨ ඔස්සේ ඔබ නොමඟ යවන්නට උත්සාහ දරන්නන් ප්‍රතික්ෂේප කරන්න.

5. ඔබේ ප්‍රදේශයේ සම්පත් හඳුනන, අවශ්‍යතා ගැන සංවේදී අපේක්ෂකයන් තෝරා ගන්න.

6. හිංසනයෙන් හා දූෂිත ක්‍රියාවලින් තොර චරිත ලෙස හඳුනාගෙන ඇති අපේක්ෂකයන් තෝරා ගන්න.

මැතිවරණ දින ඉතා සාමකාමීව හැසිරෙන ලෙසත්, අනවශ්‍ය යැයි ගැටුම්වලට නොයන ලෙසත් ඡන්දය ලබා දීමෙන් පසු ඡන්දපොල අසල නොගැවසෙන ලෙසත් අප ඔබෙන් ඉල්ලා සිටිමු.

ඡන්දදිනයේ හෝ පශ්චාත් මැතිවරණ සමයේ සිදුවන අක්‍රමිකතා අදාළ පුද්ගලයන්ට, ආයතනවලට හා පැෆ්රල් සංවිධානයට දැනුම්දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු. ඊට අදාල දුරකථන හා ෆැක්ස් අංක ඇමුණුම් 02 යටතේ දක්වා ඇත.